# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1708/8 – 2011 මැයි 30 වැනි සඳුදා – 2011.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 94/47 III

**නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත(269 වන අධිකාරය)**

6(2) (ආ) සහ 21(2) (ආ) වගන්ති යටතේ වූ නියමය

(269) වන අධිකාරය වූ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6(2) (ආ) සහ 21 (2) (ආ) වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් පිළිබඳ අමාත්‍ය විමල් වීරවංශ වන මා විසින් මේ නියමය මගින් -

(අ) ඉහත කී ආඥාපනතේ කාර්යය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය "හඟුරන්කෙත ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

සහ

(ආ) හඟුරන්කෙත ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් දල සැලසුම් යෝජනා ක්‍රමයක් සකස් කළ යුතු බවටත් විධානය කරනු ලැබේ.

විමල් වීරවංශ,
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා
පොදු පහසුකම් අමාත්‍ය.

2011 මැයි මස 09 වන දින,
කොළඹ දීය.

උපලේඛනය

**හඟුරන්කෙත ශ්‍රී විෂ්ණු දේවාල පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය**

සර්වේයර් ජනරාල්ගේ 2010 අප්‍රේල් මස 30 වන දින අංක NU/UDH/2010/22 දරන සැලැස්මේ නිරූපිත මධ්‍යම පළාතේ, නුවරඑළිය පරිපාලන දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දියතිලක කෝරළේ සුළු කොට්ඨාසයේ, හඟුරන්කෙත ග්‍රාමයේ පිහිටි පහත දැක්වෙන I වන කොටස, II වන කොටස, III වන කොටස, IV වන කොටස, V වන කොටස, VI වන කොටස, VII වන කොටස, VIII වන කොටස සහ IX වන කොටසෙහි දක්වා ඇති හෙක්ටෙයාර් 0.9977 ක විශාලත්වයෙන් යුක්ත පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය.

I කොටස

කැබලි අක්ෂර 'ඒ'

| | |
|---|---|
| උතුරට | : හල්ගහමුලවත්ත; |
| නැගෙනහිරට | : හල්ගහමුලවත්ත සහ කැබලි අක්ෂර බී; |
| දකුණට | : කැබලි අක්ෂර බී සහ මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ හල්ගහමුලවත්ත. |

II කොටස

කැබලි අක්ෂර 'බී'

| | |
|---|---|
| උතුරට | : කැබලි අක්ෂර ඒ සහ හල්ගහමුලවත්ත; |
| නැගෙනහිරට | : හල්ගහමුලවත්ත සහ කැබලි අක්ෂර සී; |
| දකුණට | : කැබලි අක්ෂර සී සහ මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.). |

III කොටස

කැබලි අක්ෂර 'සී'

| | |
|---|---|
| උතුරට | : කැබලි අක්ෂර බී සහ හල්ගහමුලවත්ත; |
| නැගෙනහිරට | : මාර්ගය; |
| දකුණට | : මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර බී. |

IV කොටස

කැබලි අක්ෂර 'ඩී'

| | |
|---|---|
| උතුරට | : මාර්ගය සහ හල්ගහමුලවත්ත කුඹුර; |
| නැගෙනහිරට | : වැව්බැම්ම; |
| දකුණට | : කැබලි අක්ෂර ජේ සහ මාර්ගය; |
| බටහිරට | : කැබලි අක්ෂර ඊ සහ මාර්ගය. |

V කොටස

කැබලි අක්ෂර 'ඊ'

| | |
|---|---|
| උතුරට | : කැබලි අක්ෂර ඩී; |
| නැගෙනහිරට | : කැබලි අක්ෂර ඩී; |
| දකුණට | : මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.). |

VI කොටස

කැබලි අක්ෂර 'එෆ්'

| | |
|---|---|
| උතුරට | : මාර්ගය (මා.සං.අ.); |
| නැගෙනහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ජී; |
| දකුණට | : කැබලි අක්ෂර ජී සහ මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.). |

VII කොටස

කැබලි අක්ෂර 'ජී'

| | |
|---|---|
| උතුරට | : කැබලි අක්ෂර එෆ් සහ මාර්ගය (මා.සං.අ.); |
| නැගෙනහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර එච්; |
| දකුණට | : කැබලි අක්ෂර එච් සහ මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර එෆ්. |

VIII කොටස

**කැබලි අක්ෂර 'එච්'**

| | |
|---|---|
| උතුරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ජී; |
| නැගෙනහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ මාර්ගය; |
| දකුණට | : මාර්ගය සහ මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර එෆ්. |

IX කොටස

**කැබලි අක්ෂර 'ජේ'**

| | |
|---|---|
| උතුරට | : කැබලි අක්ෂර ඩී සහ වැව් බැම්ම; |
| නැගෙනහිරට | : හඟුරන්කෙතවත්ත; |
| දකුණට | : මාර්ගය (මා.සං.අ.); |
| බටහිරට | : මාර්ගය (මා.සං.අ.) සහ කැබලි අක්ෂර ඩී. |

06 - 231

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.